# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2356/21 - 2023 නොවැම්බර් මස 01 වැනි බදාදා - 2023.11.01

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී.-36/1957 (vii)

**1957 අංක 49 දරන රාජ්‍ය කර්මාන්ත සංස්ථා පනත**

3 වන වගන්තිය සමග කියවිය යුතු 2 වන වගන්තිය යටතේ වූ නියමය

1957 අංක 49 දරන රාජ්‍ය කර්මාන්ත සංස්ථා පනතේ 3 වන වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 2 වන වගන්තියේ (1) වන උපවගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, සෞඛ්‍ය අමාත්‍ය වෛද්‍ය රමේෂ් පතිරණ වන මා විසින්, රජයේ අනුමතය සහිතව මෙම නියමය මගින්, 1969 මැයි මස 11 දින අංක 14853/3 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියමයේ පළමු උපලේඛනයේ අන්තර්ගත වන සහ නිශ්චිත කර්මාන්ත ව්‍යවසායන් සංවිධානය කර ඇත්තේ යම් අරමුණු සඳහා ද එම අරමුණු සංයුක්ත වන එම උපලේඛනයේ 7 වන අයිතමයට ඉක්බිතිව ම පහත දැක්වෙන කොටස ඇතුළත් කිරීමෙන් එම උපලේඛනය මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

“ 8. ආයුර්වේදය ප්‍රකාරව ප්‍රතිකාර සහ සහන සපයනු ලබන වෛද්‍ය මධ්‍යස්ථාන සහ සෞඛ්‍ය ප්‍රවර්ධන මධ්‍යස්ථාන පිහිටුවීම සහ පවත්වාගෙන යාම සඳහා මෙන්ම එවැනි මධ්‍යස්ථාන නිසි පරිදි ක්‍රියාත්මක වන බව සහතික කිරීම සඳහා උචිත තැනැත්තන් සහ ආයතන සමග ගිවිසුම්වලට ඇතුළත් වීම;

9. ආයුර්වේදය පිළිබඳ අධ්‍යයන පාඨමාලා සහ ආයුර්වේද වෘත්තියට අදාළ පුහුණු වැඩසටහන් සපයනු ලබන අධ්‍යයන ආයතන නිසි කාර්යපටිපාටි අනුගමනය කිරීමෙන් පසුව පිහිටුවීම, එවැනි පාඨමාලා සහ වැඩසටහන් තේරීම සහ සකස් කිරීම සම්බන්ධ තැනැත්තන් හෝ ආයතන සමග ගිවිසුම්වලට ඇතුළත්වීම සහ ඒ හා සම්බන්ධ දේශන පැවැත්වීම. එවැනි පාඨමාලා සහ වැඩසටහන් සාර්ථක ලෙස සම්පූර්ණ කරනු ලබන තැනැත්තන් සඳහා ඩිප්ලෝමා සහ සහතිකපත්‍ර ප්‍රදානය කිරීම;

10. වාණිජ කාර්ය සඳහා භාවිත කරනු ලැබිය හැකි වගාවේ එළදාව, අස්වැන්න හෝ අවශේෂ කොටස් ඇතුළත් වන්නා වූ ද 1961 අංක 31 දරන ආයුර්වේද පනතේ 77 වන වගන්තියේ නිශ්චිතව දක්වා ඇති ආයුර්වේද සංග්‍රහයේ නියම කරනු ලැබ ඇති පරිදි ආයුර්වේදයෙහි නියැලීමේ දී භාවිත කිරීම සඳහා වූ ද ඖෂධීය ශාක වගා කිරීම සහ එම කටයුතු නගා සිටුවීමෙහිලා උචිත තැනැත්තන් සහ ආයතන සමග ගිවිසුම්වලට ඇතුළත් වීම.”

වෛද්‍ය රමේෂ් පතිරණ,
සෞඛ්‍ය අමාත්‍ය.

2023 ඔක්තෝබර් මස 30 වැනි දින,
කොළඹ දී ය.

1A - G 40641— 56 (2023/10)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*